## අයගම ප්‍රාදේශීය සභාව

## රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 02 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 135,475 ක වියදම් සඳහා ණයහිමි වෙන්කිරීමක් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් රු. 135,475 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) කොන්ක්‍රීට් කුට්ටි ගල් ව්‍යාපෘතියේ නිෂ්පාදන ඉකුත් වර්ෂයේ ණය පදනම මත විකිණීම වෙනුවෙන් ලද රු. 397,822 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සභාව විසින් ඉකුත් වර්ෂ වල ගිණුම්ගත කර නොතිබූ ආදායම් හා වියදම් ගිණුම් විෂයයන් හා ගිණුම් වලට කරන ලද ගැලපීම් සමුච්චිත අරමුදලට ගැලපීම වාර්ෂිකව සිදුකර තිබූ බැවින් යම් වර්ෂයක මූල්‍ය ප්‍රතිඵලය කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි විය.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 11 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ වෙනස රු. 11,084,686 ක් විය.

1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි අංක 571 | 2011 වර්ෂයේ සිට රඳවාගෙන ඇති මාස 06 ක් ඉක්මවූ රු. 14,768,881 ක තැන්පතු ආදායමට නොගෙන දිගින් දිගටම රඳවාගෙන තිබුණි. |
| (ආ) | නාගරික සංවර්ධන හා පූජාභූමි අමාත්‍යාංශ ලේකම්ගේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය | දුරකථන හා සන්නිවේදන කුළුණු සඳහා අනුමැතිය ලබා දීමේදි ගැසට් පත්‍රය ප්‍රකාරව ගාස්තු අයකල යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 4,360,166 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 2,443,029 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 495 | 417 | 284 |
| බදු කුලී | 2,723 | 2,627 | 178 |
| බලපත්‍ර ගාස්තු | 465 | 341 | 17 |
| වෙනත් ආදායම් | 4,029 | 12,449 | 1,297 |

2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

-----------------------------------------

සමාලෝචිත වර්ෂයේ සේවා සඳහා ගාස්තු ආදායම් හැර වරිපනම් හා බදු, බදු කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් ඇස්තමේන්තුගත ආදායම රැස්කල ආදායම සමඟ සැසඳීමේදී රැස්කල ආදායම ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා සියයට 0.8 සිට සියයට 55.6 ක් දක්වා වූ අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.2.3 වරිපනම් බදු

-----------------

හිඟ වරිපනම් බදු ලෙස සමාලෝචිත වර්ෂය අවසාන වනවිට බදුකරුවන් 422 දෙනෙකුගෙන් රු. 60,353 ක වරිපනම් බදු අයවීමට තිබූ අතර, හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තියේ විධිවිධාන පරිදි දේපල තහනම් කිරීම වැනි විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති බදු අයකල යුතු ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා වාර්ෂික සමීක්ෂණයක් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මැයි මස වනවිටද සිදුකර නොතිබුණි. දැනටමත් සභාව වෙත ආදායම් ගෙවනු ලබන ආයතන පමණක් පදනම් කරගෙන ආදායම් ලේඛණ පවත්වා තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරු වලට අදාලව සවිස්තරාත්මක ලේඛණයක් නඩත්තු නොකරන අතර, සමාලෝචිත වර්ෂයට අදාලව තාවකාලික දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සඳහා සභාව වෙත කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

(ඇ) ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයින් 345 දෙනෙකු වෙතින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වර්ෂ ගණනාවක සිට හිඟව පවතින රු. 112,241 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් රු. 70,083 ක මුදලක් අයකර ගත යුතුව තිබුණි.

(ආ) 2014 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා මුද්දර ගාස්තු උපලේඛණ ලබාගෙන අදාල ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් වර්ෂ ගණනාවක සිට ක්‍රියාත්මක කල කොන්ක්‍රීට් කුට්ටි ගල් ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 1,400,000 ක් වෙන්කර තිබුණද, නිෂ්පාදනයක් සිදු නොකර සභාව විසින් ක්‍රියාත්මක කල මාර්ග ව්‍යාපෘති 10 ක් සඳහා කොන්ක්‍රීට් කුට්ටි ගල් 85951 ක් මිලදී ගැනීම සඳහා රු. 2,707,464 ක් සහ ඒවා ප්‍රවාහනය සඳහා රු. 300,834 ක් ලෙස සමාලෝචිත වර්ෂය තුලදී රු. 3,008,298 ක් වියදම් කර තිබූ අතර, කොන්ක්‍රීට් කුට්ටි ගල් නිෂ්පාදන යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අතහැර දමා නිෂ්කාර්යයව තිබුණි.

(ආ) සභාව සතුව සුසාන භූමි 07 ක් පවතින අතර, සභාව අයිතිවාසිකම් කියන එවැනි සුසාන භූමි 12 ක් සම්බන්ධයෙන් මිනුම් ගෙන නිරවුල් කර විධිමත් පරිදි සභාව වෙත පවරාගෙන නොතිබුණි. එම සුසාන භූමි පිළිබඳ ප්‍රමාණවත් විස්තරද සභාව සතුව නොතිබුණි.

(ඇ) සභාව සතු ස්ථාවර වත්කම් ලේඛණය නියමිත තොරතුරු ඇතුලත් කර, නඩත්තු කර පවත්වා නොතිබුණි.

3.2 සේවක ණය

-----------------

සභාවේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය නිළධාරීන් තිදෙනෙකු වෙතින් රු. 25,200 ක හිඟ ණය ශේෂයක් විගණිත දිනය වනවිටද අයකරගෙන නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

------------------------

රත්නපුර මහාධිකරණයේ විභාග වන අංක ඒපීඑල්36/2007 දරන නඩුව සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් සභාව සතුව නොමැති වුවද, එම නඩුව වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥ ගාස්තු ලෙස රු. 25,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවීම් කර තිබුණි.

3.4 විදේශ ගමන් වියදම්

--------------------------

2014 නොවැම්බර් 10 දින සිට 15 දින දක්වා පෞද්ගලික ආයතනයක් විසින් සංවිධානය කරන ලද දින 05 ක විදේශ සංචාරය සඳහා සභිකයෙකුට රු. 98,000 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත සභා අරමුදලින් ගෙවා තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් පරිදි නිවාඩු අනුමැතියෙන් අනියම් දීමනා ලබාගත යුතු වුවද, ඊට පටහැනිව රු. 39,750 ක අනියම් දීමනාද ලබාගෙන තිබුණි.

(ආ) පුහුණු වැඩසටහන පිළිබඳ විස්තර ඇතුලත් ලිපි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) පුහුණුව මඟින් ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව වාර්තාවක් පුහුණුව අවසන් වී මාසයක් ඇතුලත ලබාදිය යුතු වුවත්, එවැනි ලියවිල්ලක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) පළාත් පාලන ආයතන ප්‍රධානියෙකු හෝ නියෝජ්‍ය ප්‍රධානියෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගන්නේ නම් අදාල සංවිධානය හෝ විදේශ රාජ්‍ය හෝ විදේශ ආයතනය ඒ සඳහා වැය වන සියළු වියදම් හා පහසුකම් දැරිය යුතු වුවත්, එම චක්‍රලේඛ විධිවිධාන නොසලකා උක්ත ගෙවීම් කර තිබුණි.

3.5 නිෂ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

මෝටර් ග්‍රේඩරය හා LK – 9601 අංක දරන ලේලන්ඩ් වර්ගයේ ටිපර් රථය සභාවේ අවශ්‍යතාවයන්ට නොගැලපීම හා ප්‍රාදේශීය සභා මාර්ගයෙහි ධාවනය කිරීමට තරම් මාර්ග ප්‍රමාණවත් නොවීම මත විගණිත දිනය වනවිටත් ප්‍රමාණවත් උපයෝගීතාවයකින් තොරව සභා භූමියේ රඳවා තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

"එක ගමකට එක වැඩක්" වැඩ සටහන යටතේ ලැබූ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල අයගම කම්බොක්කාව ජල ව්‍යාපෘතිය සඳහා කාර්මික නිළධාරිනිය විසින් පිළියෙල කළ ඇස්තමේන්තුව පදනම්ව රු. 98,000 ක වටිනාකමින් යුතු ගිවිසුමකට 2014 ජූනි 20 දින එළඹ තිබුණි. එහිදී ඉදිකරන ලද කොන්ක්‍රීට් ටැංකියේ කොන්ක්‍රීට් බිත්ති වල ඇති එක් සිදුරකින් ජලය කාන්දු වන බවත්, ජල ප්‍රතිරෝධක (Water Resistant) භාවිතා කර නොමැති බැවින් කොන්ක්‍රීට් බිත්ති මතුපිට

දිය සීරාවක් ඇති වී තිබුණ බව 2015 මැයි 13 දින කරන ලද භෞතික පරික්ෂණයේදි අනාවරණය විය.

ඇස්තමේන්තුගත පරිදි GI බට වලින් රාමුව සකසා නොමැතිව ආධාරක වශයෙන් මැදින් GI බටයක් පමණක් යොදා දැල් ආවරණය සකසා තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු උපදෙස් පරිදි එම කාර්යය ඉටුකර නොතිබුණි. තවද, ලී පටි යොදා එම දැලේ ආවරණය තාවකාලිකව ටැංකියට රඳවා තිබූ අතර, ස්ථිරවම රැඳවීමට කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය